17 හැවිරිදි වියේ හෝ ඊට ආසන්න වයසක පසුවන සිසුවියකට ගුරුවරයෙකු විසින් ලිංගික අතවර සිදුකළ බවට කියැවෙන සිදුවීමක් සම්බන්ධයෙන් සඳහන් කිරීමට දිවයින කතුවැකියේ සහ මව්බිම කතුවැකියේ ඉඩ වෙන්වී තිබිණි.

එම කතුවැකි තුළ ඒ පිළිබඳව සඳහන් වී තිබූ ආකාරය අපි මෙසේ නිරීක්ෂණය කළෙමු.

1) එම සැකකාර ගුරුවරයාගේ පාදයක ඇති ආබාධය සම්බන්ධයෙන් දිගින් දිගටම සඳහන් වී ඇත. කෙසේ නමුත්, ඔහුගේ එම ආබාධ සහිත බව මෙම සිදුවීමට සම්බන්ධ වන්නේ දැයි පැනයකි. එසේ අදාළ නොවන ආබාධ සහිත බව පිළිබඳව ඉස්මතු කරමින් සඳහන් කිරීම මාධ්‍ය ආචාර ධර්ම විරෝධී බව කිව යුතු වේ.

2) මෙහි එම සැකකාර ගුරුවරයා හැඳින්වීමට භාවිතා වී ඇත්තේ "අණ්ඩ සොකට් කාලකණ්ණියෙකු" වැනි යෙදුම් වේ. මොන යම් හෝ පුද්ගලයෙකු හැඳින්වීම සඳහා මාධ්‍ය තුළ මෙවැනි භාෂා භාවිතයක් යොදාගැනීම ඔබට අනුමත කළ හැකිද? සමාජයක භාවිතයට ගැනෙන භාෂාව එම සමාජයේ චින්තනය හැඩගැස්වීමටද දායක වන බව අපි මෙහිලා අමතක නොකරමු.

3) මෙම කතුවැකි ඔස්සේ අදාළ සැකකාර ගුරුවරයාව දැනටමත් වරදකරු බව තීන්දු කර ඇත. රටේ ඕනෑම අපරාධයක් සම්බන්ධයෙන් තීන්දු තීරණ ලබාදීමට අධිකරණ පද්ධතියක් තිබියදී, මාධ්‍ය මගින් ඊට පෙරම මෙසේ යම් සැකකරුවෙකු වරදකරුවෙකු කොට තීන්දු ලබාදෙමින් වාර්තා කිරීම, මාධ්‍ය ආචාර ධර්මයන්ගෙන් අපගමනය වීමක් නොවේද?

මේ සම්බන්ධයෙන් ඔබේ අදහස් මොනවාද?

**#MediaEthicsSL #lka #sinhalanews #Divaina #Mawbima**